කහටගස්දිගිලිය ප්‍රදේශයේ මත් කුඩු හා අත්අඩංගුවට ගත් සැකකරුවෙකු රැගෙන යැමේදී පොලිස් රාජකාරියට බාධා කරමින් පිරිසක් විසින් පොලිසියට පහර දීමේ සිදුවීමක් මාධ්‍ය තුළ ආවරණය වී තිබිණි.

මෙහිදී ඇතැම් මාධ්‍ය තුළ මත්කුඩු චෝදනාවට අදාළ, සහ ඉන් අනතුරුව සිදුවූ පහරදීමේ සිදුවීමට අදාළ සැකකරුවන්ගේ නම් ගම් පුවත් වාර්තාවන් හා ඉදිරිපත් කරමින්, ඔවුන්ගේ අනන්‍යතාවයන් හෙළිදරව් කොට තිබිණි. එසේම තවත් මාධ්‍ය වාර්තාවන් තුළ ඔවුන්ව සැකකරුවන් ලෙසින් පමණක් හඳුන්වමින්, අනන්‍යතාවයන් හෙළිදරව් කිරීමකින් තොරව සිදුවීම වාර්තා කොට තිබිණි.

නීතිමය ක්‍රියාවලිය ඔස්සේ නිශ්චිතව වරදකරුවන් බවට සනාථ කෙරෙන තුරු, සැකකරුවන් නිර්දෝෂී යැයි සැලකෙන බව නීතිය පවසයි.

1) එසේ නම්, මාධ්‍ය ඔස්සේ මෙසේ සැකකරුවන්ගේ අනන්‍යතාවයන් හෙළි කිරීම සම්බන්ධයෙන් ඔබ එකඟ වන්නේ ද?

2) ඇතැම් පුවත්පතක් එසේ සැකකරුවන්ගේ අනන්‍යතාවය හෙළි නොකොට පුවත වාර්තා කර ඇත. එසේ නම්, සැකකරුවන්ගේ අනන්‍යතාවය හෙළිදරව් නොකර වුවද, එම පුවත ඉදිරිපත් කළ හැකි නොවේද?

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://ethics.journalists.org/.../naming-criminal-suspects/
https://www.inbrief.co.uk/.../media-identification-of...